029

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය - දෙවන කොටස

අවසාන පරීක්ෂණය - 2007

**ESP 2267 -** ප්‍රාථමික තලය සඳහා සිංහල භාෂාව ඉගැන්වීම

කාලය - පැය තුනයි.

---

දිනය - 2007. 06.05 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයක් සඳහාම වෙනම පොතක් භාවිතා කළ යුතුයි.

01. 1999 වර්ෂයේ සිට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රියාත්මක වූ 'දරුවා හඳුනා ගැනීම' නම් නවාංගය පිළිබඳව පසු විපරම් වැඩ සටහන්වලින් අනාවරණය කර ගත් කරුණු ද සැලකිල්ලට ගනිමින් හඳුන්වා දෙන ලද වින්දනාත්මක ක්‍රියාකාරකම් 16 න් 05 ක් පහත දැක්වේ. එම ක්‍රියාකාරකම් මගින් දරුවාට පාසල ප්‍රියජනක ස්ථානයක් බවට පත් කිරීමට හා සාර්ථක ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියක් ගොඩනැගීමට දායක කරගත හැකි අන්දම සාකච්ඡා කරන්න.

   අ. නිදහස් ක්‍රියාකාරකම්
   ආ. සාමූහික ක්‍රීඩා
   ඇ. ගායනය, වාදනය හා රංගනය
   ඈ. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
   ඉ. කතන්දර හා චිත්‍ර ඇඳීම

02. i. පළමුවන ප්‍රධාන අවධිය සඳහා නිර්දේශිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහයෙන් භාෂා කුසලතා සංවර්ධනයෙහි ලා සම්බන්ධ නිපුණතා 05 ක් නම් කරන්න.

   ii. එලෙස තෝරාගත් එක් එක් නිපුණතාව ප්‍රවීණතා මට්ටමට පැමිණ තිබේදැ'යි නිගමනය කිරීම සඳහා අවධානයට ලක් කළයුතු කරුණු මොනවාද ?

   iii. එම නිපුණතා අපේක්ෂිත ප්‍රවීණතාව ලබා ඇත්දැ'යි නිගමනය කරන නිර්ණායක වෙන් වශයෙන් ලියා දක්වන්න.

03. 'කථනය ස්වභාවිකව වර්ධනය වන කුසලතාවක් නොවේ. එය මිනිසා විසින් ඉගෙන ගනු ලබන හා පාසලේදී නිසි පරිදි සංවර්ධනය කළ යුතු කුසලතාවකි'.

i. මෙම ප්‍රකාශනය පිළිබඳව ඔබගේ අදහස් නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

ii. ළමයාගේ පෞරුෂය ගොඩනගා ගැනීම සඳහා කථන කුසලතා ප්‍රාථමික මට්ටමේ සිටම සංවර්ධනය කළයුතු අන්දම පළමුවන, දෙවන හා තුන්වන අවධි ඇසුරෙන් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

04. තුන්වන ප්‍රධාන අවධියේදී ළමයකු තුළ නිර්මාණාත්මක ලිවීම සංවර්ධනයෙහිලා දායක කර ගත හැකි කුසලතා පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඇසුරෙන් පැහැදිලි කරන්න.

අ. දෙබස් නිර්මාණය

ආ. රචනා නිර්මාණය

ඇ. චිත්‍ර හෝ සිදුවීම් ඇසුරෙන් සරල කතා නිර්මාණය

ඈ. සරල කවි

05. අ. ප්‍රවීණතාව යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැ'යි නිදසුන් තුනක් මගින් පැහැදිලි කරන්න.

ආ. යම් නිපුණතාවක් සම්බන්ධව ප්‍රවීණතා මට්ටමට පැමිණි සිසුවෙකු තුළ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ 05 ක් ලියන්න.

ඇ. ඉගෙනුම් දුෂ්කරතා අනාවරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැ'යි නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

ඈ. ප්‍රතිකර්ම ක්‍රියාමාර්ගවල ඵලදායීතාව යනුවෙන් කුමක් අදහස් කෙරේද ?

06. i. අධ්‍යාපන තාක්ෂණය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

ii. ප්‍රාථමික ශ්‍රේණිවල සිංහල භාෂාව ඵලදායී ලෙස ඉගැන්වීම සඳහා ඉගෙනුම් ආධාරක ඔබ භාවිතා කරන අන්දම පැහැදිලි කරන්න.

iii. විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් ප්‍රාථමික සිසුන්ගේ භාෂා හැකියා සංවර්ධනය කරන අන්දම නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

- හිමිකම් ඇවිරිණි. -